ET/SSS/2022(2023)/OL/62/S/Q/S-3

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education

G. C. E. Ordinary Level | අ. පො. ස. සාමාන්‍ය පෙළ | 2022 (2023)

# Student Seminar Series

## ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව

Practice Paper | උපකාරක ප්‍රශ්න පත්‍ර

# Civic Education

# පුරවැසි අධ්‍යාපනය



**Question Paper - I, II | ප්‍රශ්න පත්‍රය - I, II (සිංහල මාධ්‍යය)**

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව | ජාතික භාෂා හා මානව ශාස්ත්‍ර ශාඛාව

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

| 62 | S | I, II |
|---|---|---|

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- மாணவர் கருத்தரங்கு தொடர் - 2022 (2023)**
**G. C. E. Ordinary Level Examination – Student Seminar Series -**

පුරවැසි අධ්‍යාපනය I, II
**குடிமை கல்வி I, II**
**Civic Education I, II**

*පැය තුනයි.*
*மூன்று மணித்தியாலம்*
*Three Hours*

අමතර කියවීම් කාලය - **මිනිත්තු 10 යි.**
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time – 10 minutes

**අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.**

**පුරවැසි අධ්‍යාපනය I**

**සැලකිය යුතුයි:**

* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි** හෝ **වඩාත් සුදුසු** පිළිතුර තෝරාගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. ග්‍රීසියේ ඇතැන්ස් පෞර රාජ්‍යයේ පැවති පාලන ක්‍රමය වන්නේ,
   (1) වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය යි. (2) ඍජු ප්‍රජාතන්ත්‍රවාදය යි.
   (3) ඍජු හා වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය යි. (4) නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය යි.

2. ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක ජනතාව සතු බලය හැඳින්වෙන්නේ කුමන නමකින් ද?
   (1) ස්වාධිපත්‍යය (2) සීමිත ජන ඡන්ද බලය
   (3) පරමාධිපත්‍යය (4) අධිකාරි බලය

3. බහු පක්ෂ ක්‍රමය ක්‍රියාත්මක වන රටවල් ඇතුළත් පිළිතුර වන්නේ,
   (1) ශ්‍රී ලංකාව, ඉන්දියාව (2) මහා බ්‍රිතාන්‍ය , ඇමරිකා එක්සත් ජනපදය
   (3) කියුබාව, චීනය (4) උතුරු කොරියාව , චීනය

4. රාජ්‍යයක මූලික ලක්ෂණ දැක්වෙන නිවැරදි පිළිතුරු කාණ්ඩය වන්නේ,
   (1) භූමිය, ස්වාධිපති බලය, පරමාධිපති බලය, ජනගහනය
   (2) ආණ්ඩුව, ජන්ද බලය, ජනගහනය, ස්වාධිපති බලය
   (3) ජනගහනය, ස්වාධිපති බලය, ආණ්ඩුව, විධායකය
   (4) භූමිය, ජනගහනය, ආණ්ඩුව, ස්වාධිපති බලය

5. ක්‍රි.ව. පහළොස්වන සියවසෙන් පසු යුරෝපයේ බිහි වූ ප්‍රථම ජාතික රාජ්‍යයන් සඳහන් පිළිතුර කුමක් ද?
   (1) එංගලන්තය, ප්‍රංශය (2) ජර්මනිය, ඉතාලිය
   (3) ඕලන්දය, පෘතුගාලය (4) ජර්මනිය, ප්‍රංශය

6. ශ්‍රී ලංකාවේ පළාත් සභා සඳහා ආණ්ඩුකාරවරයෙකු පත් කිරීමේ බලය සතු වන්නේ,
   (1) මහ ඇමැතිවරයාට ය. (2) අගමැතිවරයාට ය.
   (3) අගවිනිසුරුවරයාට ය. (4) ජනාධිපතිවරයාට ය.

7. ව්‍යවස්ථාදායකයේ කාර්යයක් **නොවන්නේ** පහත ඒවායින් කුමක් ද?

(1) යුක්තිය පසිඳලීම (2) නීති සම්මත කිරීම
(3) මුදල් පාලනය කිරීම (4) විධායකය පාලනය කිරීම

8. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පරමාධිපත්‍යය පවරා ඇත්තේ මහජනතාව වෙත ය. පරමාධිපත්‍ය බලයට අයත් කාරණා වන්නේ,

(1) නිදහස , සමානාත්මතාව , අයිතිවාසිකම්
(2) ජන වර්ගය , රැකියාව , පරම බලය
(3) ස්වාධිපත්‍යය , පරම බලය , ඡන්ද බලය
(4) ඡන්ද බලය , මූලික අයිතිවාසිකම් , පාලන බලතල

- පහත ප්‍රකාශ සැලකිල්ලට ගනිමින් 09 හා 10 යන ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
  A - විධායකය ද්විත්ව ස්වරූපයක් ගනී.
  B - විධායකය ව්‍යවස්ථාදායකයට වගකීමට සෘජුව බැඳී නැත.
  C - ව්‍යවස්ථාදායකය මගින් සෘජුව විධායකය පාලනය කිරීමක් සිදු නොවේ.
  D - විධායක බලය හසුරවනු ලබන්නේ ජනාධිපතිවරයා විසිනි.
  E - ව්‍යවස්ථාදායකය තුළින් විධායකය තේරී පත් වේ.
  F - විධායකය ඉවත් කිරීමට ව්‍යවස්ථාදායකයට හැකියාව තිබේ.

9. ජනාධිපති ආණ්ඩුක්‍රමයක දක්නට ලැබෙන ලක්ෂණ ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) ABE (2) ADE (3) BCD (4) DEF

10. පාර්ලිමේන්තු ආණ්ඩුක්‍රමයක දක්නට ලැබෙන ලක්ෂණ ඇතුළත් පිළිතුර තෝරන්න.

(1) AEF (2) BCE (3) BCF (4) CDE

11. සෑම ආකාරයකම අධිකාරි බලය එක් මධ්‍යම ආයතනයක් තුළ ඒකරාශි වී තිබේ නම් එය ඒකීය රාජ්‍යයක් වේ. මෙම නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ කවුරුන් විසින් ද ?

(1) මහාචාර්ය ගානර් (2) මහාචාර්ය අයිවර් ජෙනිංග්ස්
(3) මහාචාර්ය හර්මන් ජේ ෆයිනර් (4) මහාචාර්ය ඒ. වී. ඩයිසි

12. ප්‍රාදේශීය ආණ්ඩු නැතහොත් ප්‍රාන්ත 'කැන්ටන්' නමින් හැඳින්වෙන රට කුමක් ද?
(1) ඉන්දියාව (2) මහා බ්‍රිතාන්‍යය
(3) ඇමරිකා එක්සත් ජනපදය (4) ස්විට්සර්ලන්තය

13. සන්ධීය ආණ්ඩුක්‍රමයක් පවතින රටවල් යුගලයක් වනුයේ,

(1) ඇමරිකා එක්සත් ජනපදය, ස්විට්සර්ලන්තය
(2) ප්‍රංශය, මහා බ්‍රිතාන්‍යය
(3) ඇමරිකා ඒක්සත් ජනපදය, මහා බ්‍රිතාන්‍යය
(4) මහා බ්‍රිතාන්‍යය , ශ්‍රී ලංකාව

14. මධ්‍යම ආණ්ඩුව හා පළාත් සභාව අතර සම්බන්ධීකරණය කරන නියෝජිතයා වන්නේ,

(1) ආණ්ඩුකාරවරයා ය. (2) මහ ඇමතිවරයා ය.
(3) ජනාධිපතිවරයා ය. (4) කථානායකවරයා ය.

15. ඇමෙරිකා එක්සත් ජනපදයේ මධ්‍යම ආණ්ඩුව සතු බලතලයකි,

(1) අධ්‍යාපනය (2) මූල්‍ය කටයුතු
(3) පළාත් පාලනය (4) නිවාස හා ඉදිකිරීම්

16. බහු සංස්කෘතික සමාජයක යහපාලනය ක්‍රියාත්මක වීමෙන් අත්වන ප්‍රතිඵලයක් **නොවේ;**

(1) ආගමික භේද වර්ධනය වීම
(2) අයිතිවාසිකම් තහවුරු වීම
(3) විවිධ සංස්කෘතීන් පිළිබඳ අවබෝධයක් ලැබීම
(4) ජනවර්ග අතර විශ්වාසය තහවුරු වීම

17. යහපාලනයක මූලික ගුණාංගයක් **නොවන්නේ** මින් කුමක් ද?

(1) මාධ්‍ය නිදහස ආරක්ෂා වීම
(2) පරිපාලනය අකාර්යක්ෂම වීම
(3) සම්පත් ඵලදායීව භාවිත කිරීම
(4) විනිවිදභාවයෙන් කටයුතු කිරීම

18. ගැටුම් විසදා ගැනීම සඳහා සමථකරණය යොදා ගත හැකි අවස්ථාවක් වන්නේ,

(1) ආයතනික ගැටුම් ය. (2) ජාතීන් අතර ගැටුම් ය.
(3) පාලක-පාලිත ගැටුම් ය. (4) කම්කරු ආරවුල් ය.

19. දේපළවල අයිතිය රාජ්‍ය අංශය සතු වන අර්ථ ක්‍රමය වන්නේ ,

(1) ධනවාදී අර්ථ ක්‍රමය යි. (2) සමාජවාදී අර්ථ ක්‍රමය යි.
(3) වෙළඳපොළ අර්ථ ක්‍රමය යි. (4) මිශ්‍ර අර්ථ ක්‍රමය යි.

20. ගෝලීයකරණය නිසා ශ්‍රී ලංකාවට මුහුණ පෑමට සිදු වී ඇති අහිතකර බලපෑමක් වන්නේ,

(1) විදේශ ආයෝජන ගලා ඒම ය.
(2) දේශීය යැපුම් ආර්ථිකය විනාශ වීම ය.
(3) දේශීය නිෂ්පාදන සාධකවලට ඇති ඉල්ලුම ඉහළ යෑම ය.
(4) නවීන තාක්ෂණය ගලා ඒම ය.

21. නීතිය යනු පරමාධිපත්‍ය දේශපාලන අධිකාරියක් විසින් නිකුත් කරනු ලබන ආඥාවක් වන අතර එය කඩ කිරීම දඬුවමට හේතු වේ. නීතිය පිළිබඳ මෙම නිර්වචනය ඉදිරිපත් කරන ලද්දේ,

(1) ටී. එච්. ග්‍රීන් විසිනි. (2) ජෝන් ඔස්ටින් විසිනි.
(3) ඒ. වී. ඩයිසි විසිනි. (4) එච්. ජේ. ලැස්කි විසිනි.

22. පහත සඳහන් වැරදි ක්‍රියා අතුරින් අපරාධ නීතිය යටතේ දඬුවම් හිමි වන්නේ,

(1) ඉඩම් සම්බන්ධ ගැටලුවලට ය.
(2) ගිවිසුම් කඩ කිරීම සම්බන්ධ ගැටලු සඳහා ය.
(3) මත්ද්‍රව්‍ය සම්බන්ධ ගැටලුවලට ය.
(4) විවාහ සම්බන්ධ ගැටලු සඳහා ය.

23. පරිපාලන අසාධාරණකම් පිළිබඳව සොයා බලන නිලධාරියා කවු ද?

(1) ඔම්බුඩ්ස්මන්වරයා (2) ආණ්ඩුකාරවරයා
(3) කථානායකවරයා (4) වේත්‍රධාරිවරයා

24. බාලවයස්කාරයින්ගේ භාරකාරත්වය හා දරුවන්ගේ සුජාතභාවය පිළිබඳ නඩු විභාග කළ හැකි අධිකරණය වන්නේ,

(1) මහේස්ත්‍රාත් අධිකරණය යි. (2) මහාධිකරණය යි.
(3) අභියාචනාධිකරණය යි. (4) දිසා අධිකරණය යි.

25. ශ්‍රී ලංකාවේ වැඩි ම පරිපාලන දිස්ත්‍රික්ක සංඛ්‍යාවක් තිබෙන පළාත වන්නේ,

(1) බස්නාහිර පළාත යි. (2) මධ්‍යම පළාත යි.
(3) උතුරු පළාත යි. (4) උතුරු මැද පළාත යි.

26. ශ්‍රී ලංකාවේ ද්වි මාණ්ඩලික ව්‍යවස්ථාදායකයක් පැවති ආණ්ඩු ක්‍රමය වන්නේ,

(1) කොල්බෲක් ය. (2) කෲව් මැකලම් ය. (3) ඩොනමෝර් ය. (4) සෝල්බරි ය.

27. ඩොමීනියන් ක්‍රමය අහෝසි කර, ලංකාව ස්වාධීන ජනරජයක් බවට පත් කළ ආණ්ඩු ක්‍රම ප්‍රතිසංස්කරණය වන්නේ,

(1) 1931- ඩොනමෝර් ය. (2) 1947- සෝල්බරි ය.
(3) 1972- ප්‍රථම ජනරජ ය. (4) 1978 - දෙවන ජනරජ ය.

28. මූලික අයිතිවාසිකම් ලෙස හඳුන්වන්නේ,

(1) උපතින්ම හිමි විය යුතු අයිතිවාසිකම් ය.
(2) සියලු ම මනුෂ්‍යයන්ට හිමි විය යුතු අයිතිවාසිකම් ය.
(3) ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව මඟින් තහවුරු කළ අයිතිවාසිකම් ය.
(4) ජාත්‍යන්තර සම්මුතීන් මඟින් පිළිගෙන ඇති අයිතිවාසිකම් ය.

29. ළමා ආරක්ෂාව සම්බන්ධයෙන් උපදෙස් ලබා ගැනීම සඳහා පිහිටුවා ඇති දුරකථන අංකය වන්නේ,

(1) 1918 (2) 1919 (3) 1929 (4) 1990

30. රාජ්‍ය බලය ක්‍රියාවට නැංවීමේ උත්තරීතර නීතිය වන්නේ,

(1) අපරාධ නීතිය යි. (2) මූලික නීතිය යි.
(3) සිවිල් නීතිය යි. (4) උඩරට නීතිය යි.

31. අජෛව සංරචක යුගලයක් නිවැරදි ව දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) පාෂාණ, බැක්ටීරියා (2) දේශගුණය, ශාක
(3) වායුගෝලය, ශාක (4) දේශගුණය, පාෂාණ

32. සංවර්ධනය මැනීම සඳහා යොදා ගනු ලබන මිනුම් අතරින් නූතන මිනුමක් **නොවන්නේ,**

(1) දළ ජාතික නිෂ්පාදිතය (2) මානව දරිද්‍රතා දර්ශකය
(3) හරිත දළ දේශීය නිෂ්පාදිතය (4) භෞතික ජීවන තත්ත්ව දර්ශකය

33. සංවර්ධනය වෙමින් පවත්නා රටවල් යුගලයක් දැක්වෙන පිළිතුර වන්නේ,

(1) ඉන්දියාව, සිංගප්පූරුව (2) බංග්ලාදේශය, සියොරාලියොන්
(3) ජපානය, දකුණු අප්‍රිකාව (4) බෙල්ජියම, යුක්‍රේනය

34. සමාජ පරිසරය යන්නෙන් අදහස් කරන්නේ,

(1) භෞතික සංරචකවලින් ගොඩනගන ලද්දකි.
(2) අන්තර් සම්බන්ධතාවලින් ගොඩනගන ලද්දකි.
(3) මිනිසා විසින් ගොඩ නොනගන ලද්දකි.
(4) පෘථිවියේ පවතින ස්වාභාවික සංසිද්ධියකි.

35. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නිත්‍ය සාමාජික රටවල් පමණක් දැක්වෙන පිළිතුර තෝරන්න.

(1) බ්‍රිතාන්‍යය, ඇමෙරිකා එක්සත් ජනපදය, ප්‍රංශය, ජර්මනිය, රුසියාව
(2) චීනය, ප්‍රංශය, බ්‍රිතාන්‍යය, ඇමෙරිකා එක්සත් ජනපදය, රුසියාව
(3) ප්‍රංශය, චීනය, ඉන්දියාව, රුසියාව, ජපානය, ජර්මනිය
(4) රුසියාව, ඔස්ට්‍රේලියාව, ඉන්දියාව, ඇමෙරිකා එක්සත් ජනපදය, ජර්මනිය

36. බහු සංස්කෘතික සමාජයක පුරවැසියෙකු සතු විය යුතු ගුණාංගයක් වන්නේ,

(1) අන්‍ය ආගම් වැලඳ ගැනීම ය.
(2) අන්තර් කුල විවාහ තහනම් කිරීම ය.
(3) අන්‍ය සංස්කෘතීන්ට ගරු කිරීම ය.
(4) මහ සංස්කෘතිය අනුගමනය නොකිරීම ය.

37. ක්‍රි. ව. 1776 දී මානව හිමිකම් දිනා ගැනීම සම්බන්ධයෙන් වැදගත් වන ඓතිහාසික අවස්ථාව වන්නේ,

(1) බ්‍රිතාන්‍ය මැග්නා කාර්ටා ගිවිසුම යි. (2) රුසියානු විප්ලවය යි.
(3) බ්‍රිතාන්‍ය අයිතිවාසිකම් පිළිබඳ පනත යි. (4) ඇමරිකානු නිදහස් සටන යි.

38. සාර්ක් සංවිධානයට අයත් රටක් **නොවන්නේ,**

(1) ඉන්දියාව (2) මාලදිවයින (3) ඇෆ්ගනිස්ථානය (4) මැලේසියාව

- ව්‍යවස්ථාදායකය හා අධිකරණය සතු බලතල හා කාර්යයන් කිහිපයක් A, B, C, D, E හා F වලින් දක්වා ඇත. ඒවා හොඳින් අධ්‍යයනය කර 39 හා 40 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

A - නීති විවරණය කිරීම

B - මහජන දුක්ගැනවිලි ඉදිරිපත් කිරීම

C - පුරවැසි අයිතිවාසිකම් ආරක්ෂා කිරීම

D - නීති පැනවීම

E - නීති සම්පාදනය සඳහා අවශ්‍ය උපදෙස් ලබා දීම

F - රාජ්‍ය අයවැය සම්මත කිරීම

39. අධිකරණය සතු බලතල හා කාර්යයන් පමණක් සඳහන් වන පිළිතුරු කාණ්ඩය තෝරන්න.

(1). A, B හා D (2). A, C හා D (3). A, C හා E (4). B, D හා F

40. ව්‍යවස්ථාදායකය සතු බලතල හා කාර්යයන් පමණක් සඳහන් වන පිළිතුරු කාණ්ඩය තෝරන්න.

(1). B, C හා F (2). B, D හා E (3). B, D හා F (4). B, E හා F

*****

දුරස්ථ අධ්‍යාපන ප්‍රවර්ධන ශාඛාව ජාතික භාෂා සහ මානව ශාස්ත්‍ර ශාඛාව

අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
**Ministry of Education, Sri Lanka**

| 62 | S | I, II |
|---|---|---|

**අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)**
**கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தரப் பரீட்சை- மாணவர் கருத்தரங்கு தொடர்- 2022 (2023)**
**G. C. E. Ordinary Level Examination – Student Seminar Series - 2022 (2023)**

| | |
|---|---|
| පුරවැසි අධ්‍යාපනය | I, II |
| குடிமை கல்வி | I, II |
| Civic Education | |

**පුරවැසි අධ්‍යාපනය II**

- **පළමුවන** ප්‍රශ්නය අනිවාර්ය වේ.
- **පළමුවන** ප්‍රශ්නය හා තවත් ප්‍රශ්න **හතරක්** ඇතුළුව, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

1. (i) ජාතික රාජ්‍යයක ලක්ෂණ **දෙකක්** ලියන්න .
   (ii) යුතුකම් බෙදෙන කොටස් **දෙක** නම් කරන්න
   (iii) නිෂ්පාදන සාධක **දෙකක්** නම් කරන්න
   (iv) ගැටුම් ඇති වන මූල **දෙකක්** සඳහන් කරන්න .
   (v) සිවිල් නීතිය යටතේ දඬුවම් හිමිවන වැරදි ක්‍රියා **දෙකක්** නම් කරන්න.
   (vi) නීතියේ ආධිපත්‍යය තහවුරු වූ සමාජයක දැකිය හැකි ලක්ෂණ **දෙකක්** නම් කරන්න .
   (vii) බේරුම්කරුවෙකු සතු විය යුතු ගුණාංග **දෙකක්** දක්වන්න.
   (viii) ලෝක ඉතිහාසයේ අයිතිවාසිකම් දිනා ගැනීම සම්බන්ධ වැදගත් අවස්ථා **දෙකක්** නම් කරන්න.
   (ix) භෞතික ජීවන තත්ව දර්ශකයට අයත් සංරචක **දෙකක්** නම් කරන්න .
   (x) අන්තර්ජාතික වෙළඳාම සිදු වන ප්‍රධාන ආකාර **දෙක** නම් කරන්න.

(ලකුණු 2 x 10=20)

**02.** ප්‍රජාතන්ත්‍රවාදී ගුණාංග ජන සමාජය තුළ ස්ථාපිත වීම ප්‍රජාතන්ත්‍රවාදී පාලනයේ සාර්ථකත්වයට හේතු වේ.

(i) ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයන්හි දක්නට ලැබෙන පක්ෂ ක්‍රම වල ස්වරූප **දෙකක්** ලියන්න. (ලකුණු 02)

(ii) ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක පුරවැසියෙකු සතු විය යුතු ගුණාංග **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03)

(iii)(a) ප්‍රජාතන්ත්‍රවාදී පාලනය සාර්ථක කර ගැනීම සඳහා විරුද්ධ පක්ෂයෙන් ඉටු විය යුතු යුතුකම් **තුනක්** දක්වන්න. (ලකුණු 03)

(b) ඉන් **එක්** යුතුකමක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

**03**. වාර්ගික ප්‍රශ්නයට විසඳුමක් ලෙස ශ්‍රී ලංකාවේ පළාත් සභා ක්‍රමය ස්ථාපිත කරන ලදී.

(i) උතුරු පළාතට අයත් මැතිවරණ දිස්ත්‍රික්ක **දෙක** කුමක් ද? (ලකුණු 02)
(ii) ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන පළාත් පාලන ආයතන වර්ග **තුන** නම් කරන්න. (ලකුණු 03)
(iii) (a) දහතුන් වන ව්‍යවස්ථා සංශෝධනය අනුව බලතල වර්ගීකරණය කර ඇති ලැයිස්තු **තුන** දක්වන්න. (ලකුණු 03)
(b) ඉන් එක් ලැයිස්තුවකට අයත් බලතල **දෙකක්** ලියන්න. (ලකුණු 02)

04. සංස්කෘතික සමෝදානය අතිශය වැදගත් ය.

(i) බහු සංස්කෘතික සමාජයක මූලික ලක්ෂණ **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)
(ii) ශ්‍රී ලංකාව බහු සංස්කෘතික සමාජයක් වීම කෙරෙහි බලපා ඇති සාධක **තුනක්** ලියන්න. (ලකුණු 03)
(iii) (a). අන්‍ය සංස්කෘතීන් සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමෙන් ඔබට ලැබෙන වාසි **තුනක්** ලියන්න . (ලකුණු 03)
(b) ඉන් **එක්** වාසියක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

05. සමාජයක සමූහයක් ලෙස ජීවත් වීමේ දී මිනිසාට විවිධ අවශ්‍යතා හා වුවමනාවන් ඇති වේ.

(i) මූලික අවශ්‍යතා **දෙකක්** ලියන්න. (ලකුණු 02)
(ii) ආර්ථිකයක සිදු වන ප්‍රධාන ක්‍රියාවලි **තුන** නම් කරන්න. (ලකුණු 03)
(iii) (a) ගෝලීයකරණය නිසා ලෝක ආර්ථිකය තුළ දක්නට ලැබෙන ලක්ෂණ **තුනක්** දක්වන්න. (ලකුණු 03)
(b) ඉන් **එක්** ලක්ෂණයක් කෙටියෙන් විස්තර කරන්න. (ලකුණු 02)

06. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව තුළින් පෙර තිබූ ව්‍යවස්ථාවේ අංග කිහිපයක් ම වෙනස් විය.

(i) 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවට මහජන නියෝජිතයින් තෝරා පත් කර ගන්නා ආකාර **දෙක** කුමක් ද? (ලකුණු 02)
(ii) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට ඇතුළත් කරන ලද නවාංග **තුනක්** ලියන්න. (ලකුණු 03)
(iii) (a) දහතුන් වන සංශෝධනයට අනුව බලය විමධ්‍යගත කිරීමේ දී මතු වන ගැටලු **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03)
(b) ඉහත සඳහන් **එක්** ගැටලුවක් පැහැදිලි කරන්න. (ලකුණු 02)

07. වර්තමානයේ පරිසර දූෂණයට ප්‍රබල ම හේතුව වී ඇත්තේ මානව ක්‍රියාකාරකම් ය.
(i) ජලය දූෂණය වන අවස්ථා **දෙකක්** නම් කරන්න. (ලකුණු 02)
(ii) සමාජ පරිසරයට හානි වීම නිසා මුහුණ දීමට සිදු වන අහිතකර ප්‍රතිඵල **තුනක්** ලියන්න. (ලකුණු 03)
(iii) (a) තිරසර සංවර්ධනය පවත්වා ගෙන යෑම සඳහා පුරවැසියෙකු ලෙස ඔබගෙන් ඉටු විය යුතු යුතුකම් **තුනක්** සඳහන් කරන්න. (ලකුණු 03)
(b) ඉන් **එක්** යුතුකමක් කෙටියෙන් පැහැදිලි කරන්න. (ලකුණු 02)

*****